සැ. යු. - 2012.07.27 දින පළ වූ අංක 1,769 දරන ගැසට් පත්‍රයේ III සහ IV (අ) කොටස් පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,770 - 2012 අගෝස්තු 03 වැනි සිකුරාදා - 2012.08.03

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

## IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත )

| | පිටුව |
|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... ... | 1310 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... ... | 1315 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| පළාත් පාලන සහා ජන්ද ආඥාපනත යටතේ දැන්වීම ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... ... | — |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | 1318 |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* **පළ වූ දින සිට** තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2012 අගෝස්තු මස 24 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2012 අගොස්තු මස 10 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**බී. කේ. එස්. රවීන්ද්‍ර,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ.බ.)*

2012 ජුනි මස 23 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු - ඇබෑර්තු

## මාතර මහ නගර සභාව

මාතර මහ නගර සභාවේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරු සඳහා බඳවා ගැනීමට සුදුසුකම් ඇති අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ :

| *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *මාසික වැටුප් පරිමාණය* | *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්* |
|---|---|---|---|
| මුරකරු III පන්තිය | 05 | රා.ප.ච. 6/2006 (iv) අනුව PL-1-2006 හි 12 වැනි වැටුප් පියවර වන රු. 13,060 -130x14-රු.14,880 | අවම වශයෙන් 8 ශ්‍රේණිය සමත්ව තිබීම. |
| කාර්යාල කාර්ය සහායක III පන්තිය | 01 | රා.ප.ච. 6/2006 (iv) අනුව PL-1-2006 හි 12 වැනි වැටුප් පියවර වන රු. 13,060 -130x14-රු.14,880 | අවම වශයෙන් 8 ශ්‍රේණිය සමත්ව තිබීම. |
| වාහන පාලිකා | 03 | රා.ප.ච. 6/2006 (iv) අනුව PL-1-2006 වැටුප් ක්‍රමය වන රු. 11,730 -100x18-රු.13,530 | අවම වශයෙන් 8 ශ්‍රේණිය සමත්ව තිබීම. |

*පොදු සුදුසුකම් :*

(i) අයදුම්කරු පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් ශ්‍රී ලංකා පුරවැසියෙක් විය යුතුය ;

(ii) අයදුම්කරු මාතර මහා නගර සභා බල ප්‍රදේශය තුළ අනුගාමී වසර 03ක ස්ථිර පදිංචියක් ඇති අයෙකු විය යුතුය. (ඡන්ද හිමි නාමලේඛනයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් නිකුත් කරනු ලබන සහතිකයකින් පදිංචිය සනාථ කළ යුතුය.) (මාතර මහා නගර සභාවේ දැනට ස්ථිර/අනියම්/ආදේශක /තාවකාලික/කොන්ත්‍රාත්/ඇස්තමේන්තුගත පදනම මත සේවය කරන අයදුම්කරුවන්ට පමණක් මාතර බල ප්‍රදේශයේ පදිංචිවීම අනිවාර්ය නොවේ.) ;

(iii) මාතර මහා නගර සභාවේ දැනට ස්ථිර/අනියම්/ආදේශක/තාවකාලික/කොන්ත්‍රාත්/ ඇස්තමේන්තුගත පදනම මත සේවය කරන සේවකයින් සඳහා ප්‍රමුඛතාවය ලබා දෙනු ලැබේ;

(iv) යහපත් චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතුය ;

(v) ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ 45ට නොවැඩි විය යුතුයි. (දැනට සේවයේ නියුක්ත අයට උපරිම වයස් සීමාව බල නොපැවැත්වේ. එහෙත් එම තනතුරට බඳවා ගන්නා දිනට උපරිම වයස ඉක්මවා නොතිබිය යුතුයි.

(vi) අයදුම්කරු දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියක වරදකරුවෙකු කරනු ලැබූවෙකු හෝ පළාත් රාජ්‍ය සේවයෙන් පහකරනු ලැබූවෙකු නොවිය යුතුය.;

*බඳවා ගැනීමේ ක්‍රමය :*

(i) ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකින් පසුව තෝරාගනු ලැබේ;

(ii) නියමිත සුදුසුකම් සපුරා ඇති අය පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

*සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි :*

(i) මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය.

(ii) වැන්දඹු හා අනත්දරු අරමුදලට දායකත්වය හිමිවේ.

(iii) පත්වීම අවුරුදු 03ක පරිවාස කාලයකට යටත්වන අතර, වසර තුන (03) අවසානයේ වැඩ, පැමිණීම හා හැසිරීම යහපත් තත්ත්වයේ සිටින සේවකයන්ට පමණක් ස්ථිර පත්වීම් ප්‍රදානය කරනු ලැබේ.

(iv) මෙම බඳවා ගැනීම ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ රෙගුලාසිවලටද, මුදල් රෙගුලාසිවලටද, දෙපාර්තමේන්තු නියෝගවලටද, රජයේ හෝ දකුණු පළාත් සභාව විසින් වරින් වර නිකුත් කරනු ලබන වෙනත් රෙගුලාසි හා නියෝගවලටද අනුකූලව ක්‍රියාකිරීමට සියලුම සේවකයින් බැඳී සිටිය යුතුය.

*ඉල්ලුම්කළ යුතු ආකාරය :*

අයදුම්කරු මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත අනුව ඒ4 ප්‍රමාණයේ කඩදාසියක පිළියෙල කරන ලද අයදුම්පතක් 2012.08.30 දිනට හෝ ඊට පෙර ලැබෙන සේ ''නාගරික කොමසාරිස්, මහා නගර සභාව, මාතර'' යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුයි. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරනු ලබන තනතුර ''...................'' යන්න සඳහන් කළ යුතුයි. අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරන අතර, නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අයදුම්පත් කැඳවීමෙන් පසුව හෝ කැඳවන අතරතුර දී මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීමේ පූර්ණ බලතල මාතර මහ නගර සභාවේ නාගරික කොමසාරිස් සතුවේ.

අයදුම්පත සමග පහත සහතිකවල පිටපත් ඇමිණිය යුතු අතර, මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතුය.

(i) උප්පැන්න සහතිකය ;
(ii) අධ්‍යාපන සහතික ;
(iii) පදිංචිය සහතික කිරීම පිණිස මෑතක දී ලබාගත් ග්‍රාම නිලධාරි සහතිකය (ප්‍රාදේශීය ලේකම් අනු අත්සන් කර තිබිය යුතුය);
(iv) මෑතක දී ලබාගත් චරිත සහතික 02ක් ;
(v) පළපුරුද්ද පිළිබඳ සහතික ;
(vi) මාතර මහා නගර සභාවේ සේවය කරන්නේ නම් සේවා සහතිකයක්.

රංජිත් යාපා,
නාගරික කොමසාරිස්,
මහා නගර සභාව - මාතර.

2012 ජූලි මස 12 වැනි දින,
මහා නගර සභාව - මාතර.

ආදර්ශ අයදුම්පත්‍රය

*............................................................................ තනතුර සඳහා අයදුම්පත්‍රය*

1. අයදුම්කරුගේ නම (මුලකුරු සමග) :——————————.
2. මුලකුරුවලින් හැඳින්වෙන නම් :——————————.
3. තැපැල් ලිපිනය :——————————.
3. දුරකථන අංකය :——————————.
5. උපන් දිනය : වර්ෂය :————, මාසය :————, දිනය :————.
6. ජාතික හැඳුනුම්පත් අංකය :——————————.
7. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස : අවුරුදු :————,` මාස :————, දින :————,
8. ස්ත්‍රී/පුරුෂ භාවය :——————————.
9. විවාහක/අවිවාහක බව :——————————.
10. ජාතිය :——————————.
11. ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙක්ද? එසේ නම් පරම්පරාවෙන් ද? ලියාපදිංචිවීමෙන්ද යන වග :——————————.
12. අධ්‍යාපන සුදුසුකම් :——————————.
13. පළපුරුද්ද හා වෘත්තීය සුදුසුකම් :——————————.
14. ඔබ දැනටමත් මාතර මහා නගර සභාවේ ස්වය කරන්නේ නම් :

(i) දැනට දරන තනතුර :——————————.
(ii) එම තනතුරට පත්වූ දිනය :——————————.
(iii) එම පත්වීමේ ස්වභාවය (ස්ථිර/අනියම්/තාවකාලික/ආදේශක/කොන්ත්‍රාත්/ ඇස්තමේන්තුගත පදනම මත ද) :——————————
.

මෙම අයදුම්පත්‍රයෙහි මා විසින් සපයන ලද තොරතුරු සත්‍ය වූත් හා නිවැරදිවූත් ඒවා බව මම මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරු කිසිවක් අසත්‍ය හෝ වැරදි බව මෙම තනතුරට තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සෙකු වන බවත් පත්වීම ලැබීමෙන් පසු එවැනි කරුණක් ඔප්පු වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහකරනු ලැබීමට යටත් වන බවත් දනිමි.

——————————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :——————————.

08-75/1

---

**මාතර මහා නගර සභාව**

මාතර මහා නගර සභාවේ කසළ ප්‍රතිචක්‍රීයකරණ ව්‍යාපෘතිය සඳහා පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරු සඳහා බඳවා ගැනීමට සුදුසුකම් ඇති අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ :

| *තනතුරු නාමය* | *තනතුරු ගණන* | *මාසික වැටුප් පරිමාණය* | *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්* |
|---|---|---|---|
| කම්කරු | 02 | රා.ප.ච. 6- 2006 (iv) අනුව PL-1-2006A රු. 11,730 -10x120-10x130 - 10x145 - 12 x 160 - රු. 17,600 | අවම වශයෙන් 5 ශ්‍රේණිය සමත්වී තිබීම. |

*පොදු සුදුසුකම් :*

(i) අයදුම්කරු පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් ශ්‍රී ලංකා පුරවැසියෙක් විය යුතුය ;
(ii) අයදුම්කරු මාතර මහා නගර සභා බල ප්‍රදේශය තුළ අනුගාමී වසර 03ක ස්ථිර පදිංචියක් ඇති අයෙකු විය යුතුය. (ඡන්ද හිමි නාම ලේඛනයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් නිකුත් කරනු ලබන සහතිකයකින් පදිංචිය සනාථ කළ යුතුය.) (මාතර මහා නගර සභාවේ දැනට ස්ථිර/අනියම්/ආදේශක /තාවකාලික/කොන්ත්‍රාත්/ඇස්තමේන්තුගත පදනම මත සේවය කරන කසළ ප්‍රතිචක්‍රීයකරණ ව්‍යාපෘතියේ අයදුම්කරුවන්ට පමණක් මාතර බල ප්‍රදේශයේ පදිංචිවීම අනිවාර්ය නොවේ.) ;
(iii) මාතර මහා නගර සභාවේ දැනට ස්ථිර/අනියම්/ආදේශක/තාවකාලික/කොන්ත්‍රාත්/ ඇස්තමේන්තුගත පදනම මත සේවය කරන කසළ ප්‍රතිචක්‍රීයකරණ ව්‍යාපෘතියේ සේවකයින් සඳහා ප්‍රමුඛතාවය ලබා දෙනු ලැබේ;
(iv) යහපත් චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතුය ;
(v) ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ 45ට නොවැඩි විය යුතුයි. (දැනට සේවයේ නියුක්ත අයට උපරිම වයස් සීමාව බල නොපැවැත්වේ. එහෙත් එම තනතුරට බඳවා ගන්නා දිනට උපරිම වයස ඉක්මවා නොතිබිය යුතුයි.) ;
(vi) අයදුම්කරු දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියක වරදකරුවෙකු කරනු ලැබූවෙකු හෝ පළාත් රාජ්‍ය සේවයෙන් පහකරනු ලැබූවෙකු නොවිය යුතුය.;

*බඳවා ගැනීමේ ක්‍රමය :*

(i) සම්මුඛ පරීක්ෂණයකින් පසුව තෝරාගනු ලැබේ;
(ii) නියමිත සුදුසුකම් සපුරා ඇති අය පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

*සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි :*

(i) මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය.
(ii) වැන්දඹු හා අනත්දරු අරමුදලට දායකත්වය හිමි වේ.
(iii) පත්වීම අවුරුදු 03ක පරිවාස කාලයකට යටත්වන අතර, එක් වසරක (01) අනියම් පදනම මත බඳවා ගැනේ. අනියම් පදනම මත වසරක සේවා කාලයකින් පසුව කාර්ය සාධනය පරීක්ෂා කිරීමෙන් අනතුරුව වැඩ, පැමිණීම සහ හැසිරීම යහපත් තත්ත්වයේ සිටින සේවකයින්ට පමණක් ස්ථිර පත්වීම් ප්‍රදානය කරනු ලැබේ.
(iv) මෙම බඳවා ගැනීම ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ රෙගුලාසිවලටද මුදල් රෙගුලාසිවලටද, දෙපාර්තමේන්තු නියෝගවලටද, රජයේ හෝ දකුණු පළාත් සභාව විසින් වරින් වර නිකුත් කරනු ලබන වෙනත් රෙගුලාසි හා නියෝගවලට ද අනුකූලව ක්‍රියාකිරීමට සියලුම සේවකයින් බැඳී සිටිය යුතුය.

*ඉල්ලුම්කළ යුතු ආකාරය .*

අයදුම්කරු මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත අනුව ඒ4 ප්‍රමාණයේ කඩදාසියක පිළියෙල කරන ලද අයදුම්පතක් 2012.08.30 දිනට හෝ ඊට පෙර ලැබෙන සේ "නාගරික කොමසාරිස්, මහා නගර සභාව, මාතර" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුයි. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ "කම්කරු තනතුර (කසළ ප්‍රතිචක්‍රීයකරණ ව්‍යාපෘතිය සඳහා)" යන්න සඳහන් කළ යුතුයි. අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරන අතර, නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අයදුම්පත් කැඳවීමෙන් පසුව හෝ කැඳවන අතරතුර දී මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීමේ පූර්ණ බලතල මාතර මහා නගර සභාවේ නාගරික කොමසාරිස් සතුවේ.

අයදුම්පත සමග පහත සහතිකවල පිටපත් ඇමිණිය යුතු අතර, මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතුය.

(i) උප්පැන්න සහතිකය ;
(ii) අධ්‍යාපන සහතික ;
(iii) පදිංචිය සහතික කිරීම පිණිස මෑතක දී ලබාගත් ග්‍රාම නිලධාරි සහතිකය (ප්‍රාදේශීය ලේකම් අනු අත්සන් කර තිබිය යුතුය);
(iv) මෑතක දී ලබාගත් චරිත සහතික දෙකක් ;
(v) පළපුරුද්ද පිළිබඳ සහතික ;
(vi) මාතර මහා නගර සභාවේ කසළ ප්‍රතිචක්‍රීයකරණය ව්‍යාපෘතියේ සේවය කරන්නේ නම් සේවා සහතිකයක්.

රංජිත් යාපා,
නාගරික කොමසාරිස්,
මහා නගර සභාව - මාතර.

2012 ජූලි මස 12 වැනි දින,
මහා නගර සභාව - මාතර.

ආදර්ශ අයදුම්පත්‍රය

***කසළ ප්‍රතිචක්‍රීයකරණ ව්‍යාපෘතියේ කම්කරු තනතුර සඳහා අයදුම්පත්‍රය***

1. අයදුම්කරුගේ නම (මුලකුරු සමග) :——————————.
2. මුලකුරුවලින් හැඳින්වෙන නම් :——————————.

3. තැපැල් ලිපිනය :————————.
4. දුරකථන අංකය :————————.
5. උපන් දිනය : අවුරුද්ද :————, මාසය :————, දිනය :————.
6. ජාතික හැඳුනුම්පත් අංකය :————————.
7. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස : අවුරුදු :————,` මාස :————, දින :————,
8. ස්ත්‍රී/පුරුෂ භාවය :————————.
9. විවාහක/අවිවාහක බව :————————.
10. ජාතිය :————————.
11. ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙක්ද? එසේ නම් පරම්පරාවෙන් ද? ලියාපදිංචිවීමෙන්ද යන වග :————————.
12. අධ්‍යාපන සුදුසුකම් :————————.
13. පළපුරුද්ද හා වෘත්තීය සුදුසුකම් :————————.
14. ඔබ දැනටමත් මාතර මහ නගර සභාවේ කසළ ප්‍රතිචක්‍රීයකරණ ව්‍යාපෘතියේ සේවය කරන්නේ නම් :————————.

(i) දැනට දරන තනතුර :————————.
(ii) එම තනතුරට පත්වූ දිනය :————————.
(iii) එම පත්වීමේ ස්වභාවය (ස්ථිර/අනියම්/තාවකාලික/ආදේශක/කොන්ත්‍රාත්/ ඇස්තමේන්තුගත පදනම මත ද) :————————

.

මෙම අයදුම්පත්‍රයෙහි මා විසින් සපයන ලද තොරතුරු සත්‍යවූත් නිවැරදිවූත් ඒවා බව මම මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරු කිසිවක් අසත්‍ය හෝ වැරදි බව මෙම තනතුරට තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සෙකු වන බවත් පත්වීම ලැබීමෙන් පසු එවැනි කරුණක් ඔප්පු වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහකරනු ලැබීමට යටත් වන බවත් දනිමි.

————————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————————.

08-75/2

---

## ගම්පොල නගර සභාව

ගම්පොල නගර සභාවේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරුවලට සුදුසුකම් සපුරා ඇති ගම්පොල නගර සභා සීමාව තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *පුරප්පාඩු සංඛ්‍යාව* | *වැටුප් කේත අංකය* | *වැටුප් පරිමාණය* | *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්* |
|---|---|---|---|---|---|
| 01 | පණිවිඩකරු | 01 | PL 1 2006 (A) | රු. 11,730-10x 120-10x130-10x145-10x160-රු.17,600 | දෙවරකට නොවැඩි වාර ගණනක දී හෝ ජාතික අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් සිංහල හෝ දෙමළ භාෂාව සමග අවම වශයෙන් විෂයයන් 06කින් සාමාර්ථ ලබා තිබිය යුතු ය. |
| 02 | ක්‍රීඩාභූමි භාරකරු | 01 | PL 1 2006 (A) | රු. 11,730-10x 120-10x130-10x145-10x160-රු.17,600 | දෙවරකට නොවැඩි වාර ගණනක දී හෝ ජාතික අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් සිංහල හෝ දෙමළ භාෂාව සමග අවම වශයෙන් විෂයයන් 06කින් සාමාර්ථ ලබා තිබිය යුතු ය. |
| 03 | ආරක්ෂක නියාමක | 01 | PL I 2006 (A) | රු. 11,730-10x 120-10x130-10x145-10x160-රු.17,600 | දෙවරකට නොවැඩි වාර ගණනක දී හෝ ජාතික අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් සිංහල හෝ දෙමළ භාෂාව සමග අවම වශයෙන් විෂයයන් 06කින් සාමාර්ථ ලබා තිබිය යුතු ය. |
| 04 | සෞඛ්‍ය කම්කරු | 03 | PL 1 2006 (A) | රු. 11,730-10x 120-10x130-10x145-10x160-රු.17,600 | අටවන (08) ශ්‍රේණිය සමත්වී තිබීම. |

බඳවා ගැනීම සඳහා පොදු සුදුසුකම් :-

1. අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු යි.
2. අයදුම්පත් භාරගන්නා දිනට පූර්වාසන්න වසර 03ක කාලයක් ස්ථිර පදිංචිකරුවකු වියයුතු ය.
3. අයදුම්පත් භාරගන්නා දිනට වයස අවු. 18ට නොඅඩු හා අවු. 45ට නොවැඩි විය යුතු ය.
4. අයදුම්කරු මනා සෞඛ්‍ය තත්වයකින් යුක්ත විය යුතු ය.
5. ගම්පොල නගර සභාවේ දැනට තාවකාලික/අනියම්/ආදේශක/කොන්ත්‍රාත් පදනම මත සේවයේ නියුතු සේවකයින්ට වැඩි අවධානයක් යොමු කරනු ලැබේ.
6. සේවා අවශ්‍යතාවය මත විධිමත් සම්මුඛ පරීක්ෂණයකින් සුදුස්සන් තෝරාගනු ලබයි.
7. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවකු හෝ දඬුවම් ලැබූවෙකු නොවිය යුතු යි.
8. අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතරතුර කාල සීමාවේදී හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීම ගම්පොල නගර සභාවේ ලේකම් සතු ය.

*සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි :-*

1. මෙම තනතුරු ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. බඳවාගනු ලබන සේවකයින් වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතු ය.

2. ස්ථිර පත්වීමක් අවු. 03ක පරිවාස කාලයකට යටතේ වේ.

3. මෙම බඳවා ගැනීමෙන් අනතුරුව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ මුදල් රෙගුලාසි, දෙපාර්තමේන්තු නියෝග, රජය හා මධ්‍යම පළාත් රජය හා සභාව වරින්වර නිකුත් කරනු ලබන වෙනත් නියෝග හා රෙගුලාසිවලට යටත්ව සේවය කිරීමට බැඳී සිටී.

අයදුම් කිරීමේ පිළිවෙල:-

1. අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රය A4 ප්‍රමාණයේ කඩදාසියක දෙපසම ප්‍රයෝජනයට ගනිමින් පිළියෙල කළ අයදුම්පත් 2012.08.24 වැනි දිනට හෝ ඊට පෙර ලැබෙන සේ ලේකම්, ගම්පොල නගර සභාව, ගම්පොල යන ලිපිනයට ලියාපදිංචි තැපැල් මගින් එවිය යුතු ය.

2. අයදුම්පත බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරන තනතුර සම්පූර්ණයෙන් සඳහන් කළ යුතු ය.

3. අයදුම්පත සමග පහත සඳහන් සහතිකවල පිටපත් අමුණා එවිය යුතු ය.

    01. උප්පැන්න සහතිකය,
    02. අධ්‍යාපන සහතික,
    03. පදිංචිය සනාථ කිරීමේ ප්‍රාදේශීය ලේකම්ගේ සහතිකය,
    04. ග්‍රාම නිලධාරීගෙන් ලබාගත් චරිත සහතිකය,
    05. පළපුරුද්ද සහ වෘත්තිය සුදුසුකම් පිළිබඳ සහතිකය.

අයි. එම්. එස්. කේ. එම්. ඉදිසූරිය,
ලේකම්,
ගම්පොල නගර සභාව,

2012 ජූලි මස 16 වැනි දින,
ගම්පොල නගර සභාව.

ආදර්ශ අයදුම්පත්‍රය

*මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ ගම්පොල නගර සභාවේ ………………… තනතුර සඳහා වූ අයදුම්පත්‍රය*

01. මුල¦කුරු සමග නම : —————.
02. මුල¦කුරුවලින් හැඳින්වෙන නම් : —————.
03. ස්ථිර ලිපිනය : —————.
04. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය : —————.
05. ජාතික හැඳුනුම්පත් අංකය : —————.
06. උපන් දිනය :
    අවුරුද්ද : —————. මාසය : —————. දිනය : —————.
07. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස :
    අවුරුදු : —————. මාස : —————. දින : —————.
08. ස්ත්‍රී/පුරුෂ භාවය : —————.
09. විවාහක/අවිවාහක බව : —————.

10. ශ්‍රී ලංකා පුරවැසියකු වන්නේ උපතින්ද? ලියාපදිංචි වීමෙන් ද? : —————.
11. අධ්‍යාපන සුදුසුකම් : —————.
12. වෙනත් සුදුසුකම් : —————.
13. ඔබ දැනටමත් මෙම නගර සභාවේ සේවයේ නියුක්තව සිටින්නේ නම් :

    1. දැනට දරන තනතුර : —————.
    2. ස්ථිර/අනියම්/තාවකාලික/ආදේශක/කොන්ත්‍රාත් ද යන වග : —————.
    3. එම තනතුරට පත් වූ දිනය : —————.

14. ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරුවෙකු කරනු ලැබ තිබේ ද? : —————.

මෙම අයදුම්පතෙහි මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. ඉහත සඳහන් තොරතුරු අසත්‍ය බව ඔප්පු වුවහොත් මා සේවයට බඳවා ගැනීමට පෙර නුසුදුස්සෙකු වන බව හා පත්වීම ලැබීමෙන් පසුව ඔප්පු වුවහොත් කිසිදු වන්දියක් රහිතව සේවයෙන් පහ කිරීමට යටත් වන බව ද දනිමි.

——————,
අයදුම්කරුගේ අත්සන.

දිනය : ——————.

**දැනට රාජ්‍ය සේවයේ නියුක්තව සිටින අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය**

මෙම ඉල්ලුම්කරු/කාරිය වන ………………… මහතා/මහත්මිය/මෙනෙවිය මෙම ආයතනයේ ………………… වශයෙන් සේවයේ නියුක්තව සිටී. මෙම තනතුර සඳහා තෝරා ගතහොත් ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැකි/නොහැකි බවත්, ඔහු/ඇය කුමන ආකාරයක හෝ දඬුවමකට භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර, අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි.

——————,
ආයතන ප්‍රධානියාගේ අත්සන.

නම : ——————.
තනතුර : ——————.
නිල මුද්‍රාව : ——————.

08-98

# පළාත් පාලන නිවේදන

## යාපනය මහ නගර සභාව

1975 අංක 17 දරන සමාජශාලා බලපත්‍ර ලබාදීමේ පනත

පහත නම සඳහන් තැනැත්තා විසින් ඔහුගේ නම ඉදිරියෙන් දැක්වෙන සමාජශාලාව එහි සඳහන් ස්ථානයෙහි පවත්වාගෙන යාම සඳහා 2012 වර්ෂයට ලබාගැනීම පිනිස මා වෙත අයදුම්පතක් ඉදිරිපත් කර ඇති බව 1975 අංක 17 දරන සමාජශාලා බලපත්‍ර දීමේ පනතේ 6 වන වගන්තියේ (ඈ) ඡේදය යටතේ මෙයින් දැනුම් දෙමි.

එකී සමාජශාලාව අසල හෝ එකී සමාජ ශාලාව සඳහා අපේක්ෂිත ස්ථානයේ හෝ අදාල හෝ පදිංචි යම් තැනැත්තෙකු, එම සමාජ ශාලාව සඳහා බලපත්‍රයක් නිකුත් කිරීමට විරුද්ධ වන්නේ නම්, මෙම නිවේදනය ගැසට් පත්‍රයේ පළවන දිනයේ සිට සති හතරක් ඇතුළත තම විරුද්ධත්වයට හේතු ලිඛිතව දක්වමින් පිටපත් දෙකකින් යුතුව මා වෙත ඉදිරිපත් කරන ලෙස මෙයින් දන්වමි.

ඇස්. ප්‍රණවනාදන්,
මහ නගර කොමසාරිස්,
මහ නගර සභාව,
යාපනය.

2012 ජූලි මස 10 වැනි දින,
මහනගර සභාව,
යාපනය.

| *අංකය* | *ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය* | *සමාජශාලාවේ සභාපතිද, ලේකම් ද, කළමනාකරුද, යන වග* | *සමාජශාලාවේ නම* | *සමාජශාලාවේ කටයුතු කරගෙන යාමට බලාපොරොත්තු වන ස්ථානය* |
|---|---|---|---|---|
| 01 | ඒ. ඒ. ජාන්ස්ටින්, අංක 68, රාසාවින් තෝට්ටම් වීදිය, යාපනය. | ලේකම්, | සෙවන් ලෙවන් ක්‍රීඩා සමාජය | අංක 66, රාසාවින් තෝට්ටම් වීදිය, යාපනය. |

08-76

**ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව**

දියුණු කළ ප්‍රදේශ වශයෙන් ප්‍රකාශයට පත් කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තියේ (1) වැනි උප වගන්තියෙන් ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව විසින් 2012 පෙබරවාරි මස 21 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේ දී තීරණ අංක 04(01) යටතේ සභා සම්මත කරන ලද පහත සඳහන් යෝජනාවට, එකී පනතේ ඉහත කී උප වගන්තියෙන් ප්‍රාදේශීය පළාත් පාලන සහකාර කොමසාරිස් වෙත ලැබී ඇති බලතල යටතේ මහනුවර දිස්ත්‍රික්කයේ පළාත් පාලන සහකාර කොමසාරිස් ඩී. වත්සලා මාරඹගේ මහත්මිය විසින් අනුමැතිය දෙනු ලැබ ඇති බව මහජනයා වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ආර්. පී. ගුණරත්න රාජපක්ෂ,
සභාපති,
ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව.

2012 ජූනි මස 19 වැනි දින,
කුරුඳුවත්ත පිහිටි ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවේ දී ය.

**යෝජනාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් ප්‍රාදේශීය සභා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත පිහිටි පහත උපලේඛන, විස්තර කෙරෙන ප්‍රදේශ දියුණු කළ ප්‍රදේශ වශයෙන් පිළිගත යුතු බවත්,

02. එම පිළිගැනීම යෝජනා සම්මුතියට මහනුවර දිස්ත්‍රික් පරිපාලන සහා කොමසාරිස්ගේ අනුමැතිය ලබා ගැනීමට ක්‍රියා කළ යුතු බවටත්, ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

*උපලේඛනය*

1. ඇත්ගාල ප්‍රදේශයේ ගම්පොල, නාවලපිටිය ප්‍රධාන මාර්ගයේ ජයමාලපුර 06 වන පටුමග සිට එනම්, ජයසුන්දර මහතාගේ සිල්ලර කඩයේ සිට නාවලපිටිය මාර්ගයේ නාවලපිටිය දෙසට සාර්ක් ගම්මානය පසුකර රණසිංහ කොමියුනිකේෂන් කඩය දක්වා ඇති ප්‍රමාණය දෙපසට මීටර් 300ක් දුරට,

2. කුරුඳුවත්ත ප්‍රදේශයට ගම්පොල-සිංහපිටිය දොලොස්බාගේ මාර්ගයේ සිංහපිටිය හන්දියේ සිට පළමු සැතපුම් කණුව අසල සිට එනම්, ආනන්ද මහතාගේ සිල්ලර කඩය අසල සිට කුරුඳුවත්ත නගරය පසු කර දොලොස්බාගේ මාර්ගයේ උඩහේන්තැන්න, ලෝකානන්ද විහාරස්ථානයට හැරෙන මාර්ගය අසල සිට උඩහේන්තැන්න තැපැල් කාර්යාලය දක්වා වැටී ඇති මාර්ගය දෙපසට මීටර් 300ක් දුරට.

3. කුරුඳුවත්ත නගර මධ්‍යයේ සිට එනම්, ප්‍රාදේශීය සභා කාර්යාලයේ සිට පැල්ලැපිටිය මාර්ගයේ පැල්ලැපිටිය දෙසට මාර්ගයේ කි. මී. 01ක් දුරින් පිහිටි ආර්. පී. අල්විස් මහතාගේ නිවසට පිවිසෙන මාර්ගය දක්වා ඇති දුරට දෙපසට මීටර් 300ක් දුරට.

4. කුරුඳුවත්ත නගර මධ්‍යයේ සිට එනම්, ප්‍රාදේශීය සභා කාර්යාලයේ සිට ගිරාඋල්ල මාර්ගයේ තැන්න පසුකර ඉදිරියෙන් ඇති එච්. එස්. විජේසේකර මහතාගේ නිවස ඉදිරිපිට ඇති මාර්ගය දක්වා ඇත. කි. මී. 01ක් දක්වා දුරට දෙපසට මීටර් 300 ක් දුරට.

5. කුරුඳුවත්ත නගර මධ්‍යයේ සිට එනම්, ප්‍රාදේශීය සභා කාර්යාලයේ සිට මීතලාව මාර්ගයේ කි. මී. 01ත් දුර වන කේ. පී. ආරියසිංහ මහතාගේ වෙළඳසැල දක්වා දුරට දෙපසට මීටර් 300ක් දුරට.

(මායිම්ව ඇති පහත සිතියමෙන් පෙන්නුම් කරන ප්‍රදේශ.)



08-82

# විවිධ දැන්වීම්

## දැරණියගල ප්‍රාදේශීය සභාව

දැව ප්‍රවාහනය සඳහා බදු

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 152 වැනි වගන්තිය යටතේ පැවරී ඇති බලතල ප්‍රකාර, සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, දැරණියගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ දැව ප්‍රවාහන බලපත්‍රයක් සහිතව ප්‍රවාහනය කරන වාහනයකින් රු. 5000 ක් ද, දැව ප්‍රවාහන බලපත්‍ර වලින් නිදහස් දැව ප්‍රවාහනය කිරීමේ වාහනයකින් රු. 2500ක් ද, 2012.07.01 දින සිට එක් ප්‍රවාහන වාරයක් සඳහා බදු මුදලක් වශයෙන් අය කිරීමට දැරණියගල ප්‍රාදේශීය සභාව තීරණය කර ඇති බව මෙයින් දන්වමි.

ඩබ්. ඒ. අනුර විජේසූරිය,
සභාපති,
දැරණියගල ප්‍රාදේශීය සභාව.

2012 ක්වූ මැයි මස 31 වැනි දින,
දැරණියගල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

08-83

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන

## සංශෝධිත ගාස්තු

2009 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රිම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2009 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | රු. ශ. |
|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 137 00 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... ... | 137 00 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... ... | 1,300 00 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... ... | 2,600 00 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ ගැසට් පත්‍රයේ සෑම කොටසක ම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. **2009 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

**(ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)**

| | *වාර්ෂික දායක මුදල* | *තැපැල් ගාස්තුව* |
|---|---|---|
| | *රු. ශ.* | *රු. ශ.* |
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය … … … … … … | 2,080 00 | 3,120 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) … … | 1,300 00 | 3,120 00 |
| III වැනි ඡේදය … … … … … … | 780 00 | 3,120 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) … … | 4,160 00 | 6,240 00 |
| II වැනි කොටස … … … … … … | 580 00 | 3,120 00 |
| III වැනි කොටස … … … … … … | 405 00 | 3,120 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) … … … | 890 00 | 2,400 00 |
| V වැනි කොටස … … … … … … | 860 00 | 420 00 |
| VI වැනි කොටස … … … … … … | 260 00 | 180 00 |
| අති විශෙෂ ගැසට් පත්‍රය … … … … … … | 5,145 00 | 5,520 00 |

*(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය.)*

*** තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)**

| | *පිටපතක මිළ* | *තැපැල් ගාස්තුව* |
|---|---|---|
| I වැනි කොටස : | *රු. ශ.* | *රු. ශ.* |
| I වැනි ඡේදය … … … … … … | 40 00 | 60 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) … … | 25 00 | 60 00 |
| III වැනි ඡේදය … … … … … … | 15 00 | 60 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) … … | 80 00 | 120 00 |
| II වැනි කොටස … … … … … … | 12 00 | 60 00 |
| III වැනි කොටස … … … … … … | 12 00 | 60 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) … … | 23 00 | 60 00 |
| V වැනි කොටස … … … … … … | 123 00 | 60 00 |
| VI වැනි කොටස … … … … … … | 87 00 | 60 00 |

* කොළඹ 05, කිරුළපන, මායා මාවතේ, අංක 132 හි ප්‍රකාශන කාර්යංශයේ තනිපිටපත් විකිණීම සහ දායක මුදල් භාර ගැනීමේ අධිකාරී වෙත මුදල් ලැබෙන්නට සළස්වන්න.

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙනන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවාත් හැර එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මිල දී ගැනීම සඳහා රජයේ මුද්‍රණාලයාධිපති දායක මුදල් භාර නොගනී. සියලු ම දායක මුදල් කොළඹ 05, කිරුළපන, මායා මාවතේ අංක 132 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

***සැළකිය යුතුයි.*** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත නොව රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | **2012** | | | | | |
| අගෝස්තු | 2012.08.03 | සිකුරාදා | 2012.07.20 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2012.08.10 | සිකුරාදා | 2012.07.27 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2012.08.17 | සිකුරාදා | 2012.08.03 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2012.08.24 | සිකුරාදා | 2012.08.10 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2012.08.30 | බ්‍රහස්පතින්දා | 2012.08.17 | සිකුරාදා | දහවල් | 12.00 |
| සැප්තැම්බර් | 2012.09.07 | සිකුරාදා | 2012.08.24 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2012.09.14 | සිකුරාදා | 2012.08.30 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2012.09.21 | සිකුරාදා | 2012.09.07 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2012.09.28 | සිකුරාදා | 2012.09.14 | සිකුරාදා | දහවල් | 12.00 |
| ඔක්තෝබර් | 2012.10.05 | සිකුරාදා | 2012.09.21 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2012.10.12 | සිකුරාදා | 2012.09.28 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2012.10.19 | සිකුරාදා | 2012.10.05 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2012.10.25 | බ්‍රහස්පතින්දා | 2012.10.12 | සිකුරාදා | දහවල් | 12.00 |

**බී. කේ. එස්. රවින්ද්‍ර,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ.බ.)*

2012 ජුනි මස 23 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.